## ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/01/පොදු | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2021.11 20 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත 'ඉ-ග්‍රාම නිලධාරී' පද්ධතියට ඇතුළත් කිරීම**

උක්ත මැයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක MPA/HRD/IT/26/33/e-GN Project හා 2021.11.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 23/2021 හි පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

02. ග්‍රාම නිලධාරීන් හරහා ජනතාවට ලබාදෙන සේවා ආශ්‍රිතව එදිනෙදා සිදු කරන රාජකාරි කටයුතු සඳහා ඉවහල් වන තොරතුරු රැස්කර තබා ගැනීමට හා පරිශීලනය කිරීමට අවශ්‍ය වන දත්ත පද්ධතියක් හා මෘදුකාංගයක් වන 'ඉ-ග්‍රාම නිලධාරී' (e-GN) ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සම්බන්ධව එහි සඳහන් කර ඇත.

03. එසේම, රාජ්‍ය නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත සහ මූලික ගෘහ දත්ත ඉ-ග්‍රාම නිලධාරි පද්ධතියට ඇතුලත් කිරීම කඩිනම් කිරීම සඳහා පහත සඳහන් පරිදි නිලධාරීන් නම් කර එම තොරතුරු කඩිනමින් අවශ්‍ය බව එමගින් දන්වා ඇත.

1) ඔබ ආයතනයේ (ශාඛා හෝ ප්‍රාදේශීය කාර්යාල ද ඇතුළත්ව) සියලුම රාජ්‍ය නිලධරයන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ දත්ත ඇතුළත් කිරීම පිළිබඳව සැලසුම් කිරීම හා අධීක්ෂණය සඳහා ආයතනික හෝ මානව සම්පත් සංවර්ධන විෂයය භාර ජ්‍යෙෂ්ඨතම නිලධරයෙකු නම් කිරීම.

අ.පි.බ


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச் தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

2) මෙම පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීම සම්බන්ධ ක්‍රියාවලියේ තාක්ෂණික සහාය ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ විෂයය භාර මාණ්ඩලික නිලධරයෙකු හෝ එසේ නොමැති නම් ඒ සම්බන්ධ විෂයය දැනුම ඇති මාණ්ඩලික නිලධාරියෙකු නම් කිරීම.

04 ඉහත නම් කළ සම්බන්ධීකරණ නිලධරයන් දෙදෙනාගේ තොරතුරු හා සෙසු ප්‍රධාන තොරතුරු ඇතුළත් ආයතන ප්‍රධානීන් විසින් සහතික කරනු ලැබූ වාර්තා ඇමුණුම 01 හි ආකෘතිය ප්‍රකාරව ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කර egn@moha.gov.lk යන විද්‍යුත් ලිපිනය ( E- mail) වෙත 2021.11.22 දිනට පෙර යැවීමටත්, එහි පිටපතක් chiefsec03@gmail.com මගින් මා වෙතද එවීමටත්, කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස